## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.05.29

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු උපසභාපති, සුමේද චාමින්ද බස්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01.ගරු උපසභාපති, | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02.ගරු නගර සභා මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03.ගරු නගර සභා මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 04.ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05.ගරු නගර සභා මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06.ගරු නගර සභා මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07.ගරු නගර සභා මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු සභාපති | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. නාගරික ලේකම් | ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

අපගේ මාතෘභූමිය බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදී ග්‍රහණයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරගෙන අවසාන බැවින්, මෙම ඓතිහාසික විජයග්‍රහණය සම්බන්ධව සභාවේ සතුට ප්‍රකාශ කරමින්, එම උත්තරීතර කර්තව්‍යයට නායකත්වය ලබාදුන් සේනාධිනායක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ආරක්ෂක ලේකම්තුමාටත්,ත්‍රිවිධ හමුදාවටත්,

රට වෙනුවෙන් ඇප කැප වූ අභීත රණවිරුවන්ටත්, රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්ටත් මෙම සභාවේ ගෞරවය පිරිනැමීම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් පළකරන ලදී.

(02) **ගරු උපසභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

මුලාසනයේ කටයුතු කළ ගරු උපසභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2009 වර්ෂයේ මැයි මාසයට අදාළ මහ සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම් මහතා,පුවත්පත් කලාවේදී මහතුන් සාදරයෙන් පිළිගන්නා බව පැවසීය. ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු උපසභාපතිතුමා, ගරු සභාපතිතුමාට අත්‍යාවශ්‍ය රාජකාරී කටයුත්තක් යෙදී තිබෙන බැවින්, අද දින සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බවත්, එබැවින්, සභාවේ මුලාසනය හෙබවීමට තමාට දැනුම් දුන් බවත් පැවසීය.

දශක තුනක් තිස්සේ සමස්ථ ශ්‍රී ලංකාවම භීතියට හා සන්ත්‍රාසයට පත්කල කොටි ත්‍රස්තවාදය ශ්‍රී ලංකා ද්වීපයෙන් තුරන් කොට සැබෑ නිදහසක් ලැබී පවත්වනු ලබන මුල්ම සභා වාරයේ මුලාසනය හෙබවීමට ලැබීම තමා ලද භාග්‍යයක් කොට සලකන බව දැන් වූ ගරු උපසභාපතිතුමා, ලොව බිහිසුණුම ත්‍රස්තවාදී කණ්ඩායම මේ ආකාරයට පරාජය කිරීමට ලැබීම අප සියළු දෙනාගේම භාග්‍යයක් බව පැවසීය.

ත්‍රස්තවාදයෙන් මවුබිම නිදහස් කර සැබෑ නිදහස් දේශයක පහස ලබන්නට මග විවර කරදුන් ශ්‍රේෂ්ඨ රාජ්‍ය නායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුමාණන්ටත් ,ආරක්ෂකලේකම්තුමාටත්,හමුදාපතිවරුන්ටත්,පොලිස්පති වරයා හා සිවිල් ආරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටත් සමස්ථ ජාතියේම ගෞරවය හිමිවිය යුතු බවත්, ඒ සම්බන්ධව සභාවේ කෘතඥතා පූර්වක ගෞරව ප්‍රණාමය හා සුභාශිංසනය පිරිනමන බවත් දැන්වීය.

ත්‍රස්තවාදය සමඟ විදේශ කුට බලවේග පරදවා අලුත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට ලබාදුන් පුරෝගාමීත්වය නැවත නැවතත් අභිමානයෙන් යුතු සිහිපත් කල ගරු උපසභාපතිතුමා, ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටන ජයගත්තා සේම අපගේ දේශය ගොඩනැංවීමේ භාරදූර කර්තව්‍ය අප ජයග්‍රහණය කළ යුතුව තිබෙන බවත්, ඒ සඳහා ප්‍රාදේශීය නායකයින් වන අපගේ ද සහයෝගය අතිගරු ජනාධිපතිතුමන් වෙත ලබාදීමට කටයුතු කරමු යැයි පැවසීය.

වැඩිදුරට අදහස් දැක් වූ ගරු උපසභාපතිතුමා, මෙම සභාවේ ගරු සභාපතිතුමා දක්ෂ කාර්යශූර සභාපතිවරයෙකු බවත්, නගරයේ කටයුතු අධීක්ෂණය සදහා එතුමා උදෑසන 06.00 වන විට නගරයට පැමිණෙන බව තමා නිරන්තරව දැක තිබෙන බවත්, බදු ගෙවන ජනතාවට අවශ්‍ය පොදු පහසුකම් සලසමින් බළන්ගොඩ නගරය ඉතා දැකුම්කළු සුන්දර නගරයක් බවට පත්කිරීමට ක්‍රියාකර තිබෙන බවත් පැවසීය.

පිට ප්‍රදේශ වලින් මෙම ප්‍රදේශයට පැමිණෙන ජනතාව බළන්ගොඩ නගරයේ අලංකාරත්වය සම්බන්ධව සතුටුවන බවත් ඒ සම්බන්ධව අප සියළු දෙනාටම ආඩම්බර විය හැකි බවත්, මෙවැනි සුන්දර පුරවරයක් නිර්මාණය කිරීමට ඇප කැප වී ක්‍රියාකරන ගරු සභාපතිතුමාට සභාවේ ගෞරවය පිරිනමන බවත් පැවසීය.

පළාත් පාලන ආයතන හමුවේ පවතින ප්‍රධානතම ගැටළුව බවට පත්ව ඇත්තේ කැලි කසල නිසි කළමනාකරණය කරගැනීමට නොහැකිවීම යැයි පැවසූ එතුමා, බළන්ගොඩ නගර සභාව මේ වන විට එම අභියෝගය ජයගෙන ඉතා සාර්ථකව ඝන අපද්‍රව්‍ය කළමණාකරනය කිරීමේ වැඩ සටහනක් හඳුන්වාදී තිබෙන බවත්, පැවසීය. මෙම ව්‍යාපෘතියේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් විශාල දායකත්වයක් ලබාදෙන බවත්, මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පිළිසරු ව්‍යාපෘතිය අනුග්‍රහය ඇතිව ලක්ෂ 78 ක වියදමකින් ඉදිකල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නව අංගනය ඊයේ දිනයේ ගරු පරිසර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා අතින් විවෘත කල බව පැවසීය. එතුමා මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉතාමත් අගය කල අතර, ඒ සම්බන්ධව එතුමාගේ ප්‍රශංසාව පළකර සිටි බවත්, මෙම ව්‍යාපෘතිය අනෙකුත් පළාත් පාලන ආයතන වලට ආදර්ශයක් වන බවත් සඳහන් කල බව දැන්වීය. ඒ සම්බන්ධව තමාගේ ස්තුතිය ගරු සභාපතිතුමා , ගරු මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා,කාර්යාල මණ්ඩලය හා සේවක මහත්ම මහත්මීන් වෙත පිරිනමන බව දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

- ❖ සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ අභාවය සම්බන්ධව ශෝකය පළකිරීමට විනාඩියක නිශ්ශබ්දතාවයක් පළකිරීමට ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- ❖ ඒ අනුව විනාඩියක නිශ්ශබ්දතාවයක් පළකරමින් එතුමා වෙනුවෙන් සභාවේ ශෝකය පළකරන ලදී.

( 03). **2009.04.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව හා 2009.05.11 දින පවත්වනු ලැබූ විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2009.04.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව හා 2009.05.11 දින පවත්වනු ලැබූ විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් එම වාර්තාවන් සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාවන් සමාලෝචනය කිරීම:**

පසුගිය වාර්තාවන් සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ඉදිරිපත් කර ඇත ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **සාමය සඳහා වන නගරාධිපති සම්මේලනය 7 වන මහා සමුළුව 2009 අගෝස්තු 07 සිට 10 වැනිදා දක්වා නාගසාකි නගරය-ජපානය**

ඉහත කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සංසදයේ ජාතික සම්බන්ධීකාරක විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඒ අනුව, 2009 අගෝස්තු 07 සිට 10 දක්වා ජපානයේ නාගසාකි නගරයේ පැවැත්වෙන සාමය සඳහා වන නගරාධිපති සම්මේලනය සඳහා මෙම නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සහ ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමන් සහභාගීවීමට අපේක්ෂා කරන බැවින්, ඒ සඳහා එතුමන්ලා සහභාගීකරවීම සුදුසු බව එදින සභාවේ ගරු සභාපති වශයෙන් කටයුතු කළ උපසභාපති, සුමේද චාමින්ද බස්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව සලකා බැලූ සභාව , මෙම සංචාරයට අදාල ගුවන් ටිකට්පත් ගාස්තු ,වීසා ගාස්තු හා අනෙකුත් යැපීම් දීමනා ද සභා අරමුදලින් දැරීම සඳහා සභා අනුමැතිය ලබාදෙන ලදී. අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:02 **පාර පිරිසිදු නොකිරීම සම්බන්ධවයි:**

ඉහත සඳහන් කරුණට අදාළව , බළන්ගොඩ ,බාන්ස්රත්වත්ත මාවත, අංක: 82/7 දරණ ලිපිනයේ පදිංචි එච්.ජී.සෙනරත් මිහිඳුකුල මහතා විසින් එවා ඇති 2009.05.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත සඳහන් ලිපිනයේ ඇති තමාගේ නිවසට එන පාර බොහෝ සෙයින් වල් බිහි වී ඇති අතර, මෙම මාර්ගය නිවාස ගණනාවකට යන එන මාර්ගයක් බවත්, මෙම මාර්ගය අවට පදිංචිකරුවන්ට කුලිය ගෙවා නිරන්තරව මෙම මාර්ගය පිරිසිදු කිරීමට සිදුව ඇති බවත්, එබැවින්, මෙම මාර්ගය පිරිසිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සභාවේ අවධානය යොමු කල අතර, මීට පෙර මේ සම්බන්ධව සභාව විසින් ගෙන ඇති තීරණය පරිදි කටයුතු කිරීමට තීරණය කරන ලදී.

05:03 **ත්‍රීරෝද රථ ධාවනයට යෙදවීමට අවසර ඉල්ලීම:**

බළන්ගොඩ , කිරිදිගල පල්ලිය ඉදිරිපිට සිය කුළී රථ (ත්‍රීරෝද රථ)නවතා තබා ධාවනය කරවීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් එන්. ලාල් නිශාන්ත, චමින්ද නාරාංගොඩ, චමින්ද ප්‍රසාද්, ටී.කුමාරසූරිය, රංජිත් සමරනායක යන අය විසින් ඉදිරිපත් කර ඇති 2009.05.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සභාව සතු ඉඩමක් නොපවතින බැවින් හා මාර්ග තදබදයට එම ඉල්ලන ස්ථානය හේතුවක් වන බැවින්, එම ස්ථානය ලබාදීමට නොහැකි බව දන්වා යැවීමට සභාව තීරණය කරන ලදී.

05:04 **පොසොන් මහා බත් දන්සලː**

බළන්ගොඩ , පොදු වෙළඳසල, සමාජ සේවා පදනම විසින් වාර්ෂිකව පවත්වනු ලබන ලබන දන්සල මෙවරත් ජුනි මස 07 වන පොසොන් පොහෝ දින පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත්, එම කාර්ය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලමින් දන්සල් කමිටුවේ ප්‍රධාන ලේකම් විසින් එවා ඇති 2009.05.29 දිනැති ලිපිය සභාගත කරන ලදුව, සෙනසුරාදා දින පොළ පැවැත්වීමටත්, එමගින් ඉල්ලා ඇති සහයෝගයන් ලබාදීමටත් තීරණය කරන ලදී.

05:05 **ස්තුතිය පළකිරීමː**

බළන්ගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු නියෝජ්‍ය අමාත්‍ය ක්ලිෆර්ඩ් සේනක රත්වත්ත මැතිතුමාගේ තුන්මස දානමය පිංකම සඳහා මෙම නගර සභාව විසින් ලබාදුන් සහයෝගය අගය කරන අතර, ඒ සම්බන්ධව එම පවුලේ ස්තුතිය ගරු සභාව වෙත පළකරන බව දන්වමින්, කමල් එස් රත්වත්ත මහතා විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

05:06 **ජාතික රණවිරු දිනය - සබරගමුව පළාත් උත්සවය 2009.06.06 දින - රත්නපුර නව නගරයේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදීː**

උක්ත කරුණට අදාළව, සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් එවා ඇති 2009.05.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ජාතික රණවිරු දිනය සබරගමුව පළාත් උත්සවය 2009.06.06 දින රත්නපුර නව නගරයේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදී පැවැත්වෙන බැවින්, මෙම ඓතිහාසික අවස්ථාව සඳහා බැනර් දෙකක් හෝ කීපයක් ප්‍රදර්ශනය කිරීමෙන් මෙම වැදගත් කාර්යය සාර්ථක කරුගනීමට සහය ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

සභා අරමුදලින් බැනරයක් ප්‍රදර්ශනය කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **වරිපනම් බදු නිදහස් කරගැනීමː**

තානායම් පිවිසුම් පාරේ අංකː 21/6 1/1 දරණ ස්ථානයේ විදේශ රැකියා ඒජන්සියක් නොමැති බවත්, එබැවින්, එම දේපල වරිපනම් ලේඛණයෙන් ඉවත්කරදෙන ලෙස ඉල්ලමින්, ජේ.එල්.ජස්ටින් ප්‍රනාන්දු මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, එම ස්ථානයේ එවැනි ආයතනයක් පවත්වාගෙන නොයන බැවින්, වරිපනම් ලේඛණයෙන් එම දේපල ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **සේවය ස්ථිර කරදෙන ලෙස ඉල්ලා සිටීමː**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ ,බස්නැවතුම්පල ,රථවාහන පාලක එම්.ජී.පියසේන මහතා විසින් එවා ඇති 2009.05.26 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

තමා බළන්ගොඩ බස්නැවතුම්පලේ අවුරුදු 12 කට අධික කාලයක් අඛණ්ඩව කොමිස් පදනම මත රථ වාහන නැවතුම් ගාස්තු කිරීමේ කටයුතු ඉටුකල බවත්, මෙම කාලය තුළ තමා විසින් අවංකව සිය , රාජකාරී කටයුතු කිසිදු ගැටළුවකින් තොරව ඉටුකළ බවත්, තමා විසින් මසකට රු.1,50,000/-බැගින් වසරකට රු.18,00,000/- ක පමණ වූ මුදලක් වාර්ෂිකව එකතු කර කාර්යාලයේ තැන්පත් කරනු ලබන බවත්, මෙසේ තැන්පත් කරනු ලැබූ මුදලින් තමා හට

කොමිස් මුදලක් පමණක් ලැබෙන අතර, සේවක අර්ථසාධක හෝ වෙනයම් පාරිතෝෂික දීමනාවක් ද නොලැබෙන බවත්, තමාගේ ඉදිරි අනාගතය සම්බන්ධව සලකා බලා තම සේවය ස්ථිර කරදෙන මෙන් එමගින් ඉල්ලා තිබිණ.

සේවය ස්ථිර කිරීමට තනතුරක් නොමැති බැවින්, නව තනතුරක් ඇතිකිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:09 **අනඳමෙත්ගම ප්‍රජාශාලාව සහ ඉඩම**

ඉහත සඳහන් කරුණට අදාළව, අනඳමෙත්ගම නිවාස සංවර්ධන හා සුභසාධක සංගමයේ ලේකම් විසින් එවා ඇති 2009.04.23 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

අනඳමෙත්ගම , ගම පසුගිය කාලයේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යටතේ පැවති අතර, දැනට එය බළන්ගොඩ නගර සභාවට පැවරී ඇති බවත්, නමුත්, මෙම ප්‍රජාශාලාවට වැසිකිළි , ජල පහසුකම් නොමැති අතර, මෙම ප්‍රජා ශාලාව වටා ඉඩම (පර් 30) ආරක්ෂිත වැටක් සහ ප්‍රජාශාලවේ ආරක්ෂාව සඳහා ගේට්ටුවක් ද නොමැති බව දන්වමින්, එම අඩුපාඩු සපුරා දෙන ලෙස යථෝක්ත ලිපියෙන් ඉල්ලා තිබිණ.

සභාවට පවරාගැනීමෙන් පසුව සංවර්ධන කටයුතු ඉටුකිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:10 **බුලත්ගම සුනන්දාරාම මාවතේ අබලන් වූ බෝක්කුව.**

බළන්ගොඩ, බුලත්ගම සිරි සුනන්දාරාම මාවතේ පන්සලට හැරෙන හන්දිය අසලට බෝක්කුවක් යොදා තිබුණු බවත්, පසු කාලයේ විවිධ හේතූන් මත එම බෝක්කුව වැසී ගිය බවත්, වර්ෂා කාලවල දී ඉහල පෙදෙසින් ගලා එන ජලය පාර හරහා ගලා යාම නිසා, එම මාර්ගය අබලන් වී ඇති බැවින්, නැවත එම බෝක්කුව සකස් කරදෙන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන්නේ නම්, විහාරස්ථානය මගින් එය සකස් කිරීමේ කාර්යය ඉටුකල හැකි බවත් දන්වමින්, බළන්ගොඩ සිරි සුනන්දාරාම විහාස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ විසින් එවා ඇති 2009.05.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම කාර්යය ඉටුකරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **කරව්කැටිය ජල ටැංකිය පාරේ කොටසක දෙපස කැලය ශුද්ධ පවිත්‍ර නොකිරීම, කාණු ගොඩ නොදැමීම හා කසල ගෙන නොයෑමෘ**

ඉහත සඳහන් කරුණට අදාළව, බළන්ගොඩ, බාන්ස්රත්වත්ත මාවත අංකඃ82/4 දරණ ලිපිනයේ පදිංචි ඒ.ඩී.ආරියදාස යන අය විසින් එවා ඇති 2009.05.26 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

නීතීඥ දේශබන්ධ සූරියපටබැඳි මහතාගේ නිවස ඉදිරිපිට තිබෙන නිවාස 04 යන කරව්කැටිය ජල ටැංකිය පාරේ අවසාන කොටස දැනට වසර 02 ක පමණ කාලක සිට ශුද්ධ පවිත්‍ර නොකිරීම, කාණු ගොඩනොදැමීම, හා කසල ගෙන නොයෑම හේතුවෙන් එම ප්‍රදේශවාසීන් මහත් අපහසුතාවකට ලක්ව ඇති බව එමගින් අවධාරණය කර තිබිණ.

ශ්‍රමදානයක් මගින් මෙම කාර්යය ඉටුකරදීමට සභාව තීරණය කරන ලදී.

05:12 **පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා නව බඳවා ගැනීම් හා පුරප්පාඩු පිරවීම තාවකාලිකව අත්හිටුවීමඃ**

ඉහත කරුණ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් එවා ඇති DMS/AB හා 2009.03.04 දිනැති ලිපියේ තීරණයන් 2009.04.01 දින සිට නැවත දන්වන තුරු බලාත්මක වන බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බවත්, ඒ අනුව කටයුතු කරන ලෙස දන්වමින්, පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.04.07 දිනැති ලිපිය සභාගත කරන ලද

අතර, මේ අනුව කිසිදු බඳවා ගැනීමක් සිදුකල නොහැකි බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරිම** : ( රු.10000/- ට වැඩි ගෙවීම් )

2009.04.27 සිට 2009.05.26 දක්වා රු.10,000/= ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාව ඉදිරිපත් කිරීම.

| දිනය | විස්තරය | ව.අ. | මුදල |
|---|---|---|---|
| 2009.04.27 | ජෝති ස්ටෝර්ස්<br><br>කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 50 | 15,967.00 |
| | මධ්‍යම පරිසර අධිකාරිය ගි.අ. 0002937414<br><br>පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය වැඩ සටහන යටතේ පළාත් පාලන ආයතනවල කොම්පෝසට් බඳුන් ලබා ගැනීම.<br><br>බඳුන් 100<br>කොන්ක්‍රීට් තහඩු 100 | 51 | 103,235.00 |
| | ඉලෙක්ට්‍රොනික් ට්‍රේනින් ලැබෝටරි මැනුෆැක්චරින් පුද්ගලික සමාගම<br><br>ඇගිලි සලකුණු යන්ත්‍රයක් මිළදී ගැනීම - 55,000.00<br>UPS - 9,500.00<br>12 % VAT - 7,740.00<br>ප්‍රවාහන ගාස්තු - 8,400.00<br>එකතුව -80,640.00 | 52 | 80,640.00 |
| 2009.04.29 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br><br>2009 මාර්තු දුරකථන බිල පියවීම.<br>2287275 - 8,154.17<br>2287153 - 3.780.75<br>2286596 - 1,518.49<br>2288737 - 6,587.22<br>ඊ-මේල් - 226.26<br>එකතුව-20,266.89 | 54 | 20,266.89 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br><br>නාගරික මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත් පියවීම<br>87023 (2009 පෙබ: - මාර්තු) - 8,016.19<br>87022 (2009 මාර්තු) - 2,468.70<br>87024 (2009 පෙබ: - මාර්තු) - 2,266.33<br>2452931 (2009 පෙබරවාරි) - 2,283.36<br>2452932 (2009 පෙබ: - මාර්තු)- 4,780.29<br>2452939 (2009 ජන: - මාර්තු) - 3,887.12<br>88400 ( 2009 මාර්තු ) - 3,686.33<br>එකතුව - 27388.32 | 55 | 27,388.32 |
| 2009.04.29 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.03.06 සිට 2009.03.12 දින දක්වා ඉන්ධන බිල පියවීම<br><br>ප්‍රමාණය / ඒකකමිල / වටිනාකම<br>ඩීසල් ලී.714 70.20 50,122.80<br>එන්ජින් ඔයිල් ලී.02 395.00 790.00<br>පැට්‍රල් ලී.34 120.20 4,086.80<br>ටූ-ටී ලී.01 157.00 157.00<br>එකතුව 55,156.60 | 56 | 55,156.60 |

| | | | |
|---|---|---|---|
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධසේවා සමිතිය<br>2009.03.02 සිට 2009.03.18 දක්වා ඉන්ධන බිල<br>**ප්‍රමාණය** **ඒකකමිල** **වටිනාකම**<br>ඩීසල් ලී.837 70.20 58,757.40<br>පැට්‍රල් ලී.42 120.20 5,048.40<br>63,805.80 | 57 | 63,805.80 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br><br>2009 මාර්තු මාසයේ විදුලිබිල<br>පොදු වෙළඳසැල - 10,650.00<br>ප්‍රේක්ෂකාගාරය - 435.00<br>- 11085.00 | 58 | 11,085.00 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br><br>2009 මාර්තු මාසයේ විදුලිබිල<br>කාර්යාලය - 13,597.50 | 59 | 13,597.50 |
| | සාමාන්‍යාධිකාරී, ජලසම්පාදන මණ්ඩලය<br><br>2009 මාර්තු මාසයේ ජලබිල<br>පොදු වෙළඳසැල - 11,278.40<br>පිංතාලිය - 784.00<br>- 12,062.40 | 62 | 12,062.40 |
| | **2009 මැයි මාසය** | | |
| 2009.05.05 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.03.18 සිට 2009.03.25 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>**ප්‍රමාණය** **ඒකකමිල** **වටිනාකම**<br>ඩීසල් ලී.630 70.20 - 44,226.00<br>එන්ජින් ඔයිල් ලී.10 285.00 2,850.00<br>ගියර් ඔයිල් ලී.05 කෑන් 2 1972.00 3,944.00<br>පැට්‍රල් ලී.42 120.20 5,048.40<br>ටූ-ටී ලී.01 157.00 157.00<br>56,225.40 | 05 | 56,225.40 |
| | කැලණි ඒජන්සිස්<br><br>බැංකියවත්ත වැඩබිමේ වැසි ජලය පොම්ප කර ඉවත් කිරීම සඳහා අවශ්‍ය උපාංග සහිතව වතුර මෝටරයක් මිලදී ගැනීම | 07 | 22,358.00 |
| | කළමණාකරු සමෘද්ධි බැංකු සංගමය<br><br>කොටුගොඩැල්ලේ සිට දෙනිපිට ඇල්ල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම<br><br>රුඳවුම් - 43,856.40<br>ගිවිසුම් ඇප - 24,734.00<br><br>- 68,590.40 | 09 | 68,590.40 |

| | | | |
|---|---|---|---|
| | තුඹගොඩ ගොවි සංවිධානය<br><br>ඉපිටපැත්ත අස්වැද්දුම මාර්ගය, බැංකියවත්ත සම්බන්ධ පාර බෝක්කු දමා සංවර්ධනය කිරීම.<br><br>රැඳවුම ආපසු ගෙවීම - 43,319.17<br>ගිවිසුම් ඇප - 24,528.00<br><br>වෙට්නෝල් පාර ජල ටැංකිය<br>පළමු පටුමග කොන්ක්‍රීට් කිරීම<br><br>රැඳවුම් - 41,994.31<br>ගිවිසුම් ඇප - 23,893.00<br><br>- 133,734.48<br>1% රැඳවුම් අඩු කිරීම - 14,511.98<br>119,222.50 | 10 | 119,222.50 |
| | බී.ගුණරත්න<br><br>නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් සැපයීම<br>2009.04.16 සිට 2009.04.30 දක්වා | 11 | 86,708.00 |
| 2009.05.06 | සිරි විජය ග්‍රාම සංවර්ධන සමිතිය<br><br>තුඹගොඩ කෝපිවත්ත ජල යෝජනා ක්‍රමයේ 10% රැඳවුම් මුදල් ගෙවීම හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම<br><br>10% රැඳවුම් - 50,313.12<br>ඇපතැන්පත් -26,685.42<br>-76,998.54 | 12 | 76,998.54 |
| | කේ.ඩී.නිශාන්ත<br><br>කාර්යාලයීය දුරකථන පද්ධතිය නඩත්තු කිරීම සඳහා 2009.05.05 දින සිට වසරක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කිරීම. | 16 | 19,500.00 |
| | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්<br><br>බළන්ගොඩ තානායම අලුත් වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 18 | 22,270.00 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br><br>බැංකියවත්ත ගලිවල අසල ගොඩනැගිල්ල හා නගර සභා නො.04,06,08 නිල නිවාස අලුත්වැඩියා වෙනුවෙන් තීන්ත ලබා ගැනීම. | 19 | 110,798.00 |
| | දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්<br><br>රඳවාගැනීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම. | 21 | 71,036.80 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>තානායම අලුත්වැඩියාව සඳහා සිමෙන්ති මිටි 50ක් මිළදී ගැනීම.<br><br>50 x 770 - 38,500.00 | 22 | 38,500.00 |

| | | | |
|---|---|---|---|
| | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br><br>නව බස්නැවතුම්පල ඉදිරිපිට බැම්ම බැඳ දැල් ගැසීම හා බැංකියවත්ත මල ප්‍රවාහන පද්ධතිය ප්‍රවේශ මාර්ගය සඳහා ගේට්ටුවක් ඉදිකිරීම | 23 | 236,705.94 |
| | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන්<br><br>බළන්ගොඩ නගර සභාව සඳහා ලී.200 තාර බැරල් 30ක් මිළදී ගැනීම.<br><br>ලී. 01 - 93.55<br>ලී.200 බැරලයක් - 18,710.00<br>බැරල් 30 x 18,710 - 561,300.00 | 26 | 561,300.00 |
| 2009.05.12 | සාමාන්‍යාධිකාරී, බළන්ගොඩ විවිධ සේවා සමිතිය<br><br>උතුරේ අවතැන් වූ ජනතාවට ආධාර දීම සඳහා මුදල් ගෙවීම<br><br>සීනි කි.ග්‍රෑ. 01 පැකට් 100 x 82 - 8,200.00<br>පරිප්පු කි.ග්‍රෑ.01 පැකට් 100 x 199 - 19,000.00<br>ඇන්කර් පැකට් 55 x 235 - 12,925.00<br>- 40,125.00 | 27 | 40,125.00 |
| | හේලීස් ඇග්‍රෝ පොඩක්ස් ලිමිටඩ්<br><br>සෞඛ්‍ය අංශයේ ප්‍රයෝජනය සඳහා සෝල්ෆැක්ස් ලීටර් 05ක් මිලදි ගැනීම. | 32 | 37,850.00 |
| | ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br><br>නගර සභාවට අයත් නො.04, 06,08 නිල නිවාස අලුත්වැඩියාව වෙනුවෙන් උපාංග මිලදී ගැනීම. | 33-1 | 13,830.00 |
| | ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br><br>බැංකියවත්ත මධ්‍යස්ථානයේ ඉදිකල ගොඩනැගිල්ලේ වහලයට සවිකිරීම සඳහා අවශ්‍ය උපාංග මිලදි ගැනීම. | 33.2 | 11,362.50 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.03.27 සිට 2009.04.01 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>ප්‍රමාණය ඒකකමිල වටිනාකම<br>ඩීසල් ලී.616 70.20 43,243.20<br>බ්‍රේක් ඔයිල් ලී.01 518.00 518.00<br>පැට්‍රල් ලී.34 120.20 4,086.80<br>ඩී.එස්.කෑන් ලී.01 1558.00 1,558.00<br>49,406.00 | 34 | 49,406.00 |
| | ටී.ඒ.ටී.එච්.තෙඹුවන<br><br>46-4907 ට්‍රේලරයේ සම්පූර්ණ අලුත්වැඩියාව | 35 | 38,950.00 |
| | මෙට්‍රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ් | 36 | 14,465.40 |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයේ ඡායාපිටපත් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම | | |
| 2009.05.14 | සාමාන්‍යාධිකාරී, ජලසම්පාදන මණ්ඩලය<br><br>2009 අප්‍රේල් මාසයේ ජලබිල<br>පොදු වෙළඳසැල - 16,206.40<br>පිංතාලිය - 1,407.84<br>- 17,614.24 | 40 | 17,614.24 |
| | ජේ.ජී.පී.වික්‍රමසිංහ<br><br>මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට 2009 අප්‍රේල් මස දිනපතා හා සතිපතා පුවත්පත් සැපයීම | 42 | 13,780.00 |
| | සෙනෙවිරත්න ස්ටෝර්ස්<br><br>විදුණැන පියස මධ්‍යස්ථානය සඳහා නිල් කමල් පුටු 50ක් එකක් රු.875/= බැගින් මිලදී ගැනීම | 45 | 43,750.00 |
| | එම්.එච්.එම්.ගවුස්<br><br>කසල කලමනාකරණ මධ්‍යස්ථානයේ පොහොර හැලීම සඳහා පොහොර හලන යන්ත්‍රයක් සැපයීම වෙනුවෙන් 20% පළමු අත්තිකාරම් මුදල ගෙවීම. | 46 | 179,000.00 |
| | එම්.ජී.පියසේන<br><br>2009.04.06 දින සිට 2009.05.06 දින දක්වා එකතු කරන ලද පෞද්ගලික බස්ගාල් ගාස්තු තැන්පත් 15% ආපසු ගෙවීම. | 47 | 19,500.00 |
| | දේශීය ආදායම් කොමසාරිස්ගේ වැට්බදු ගෙවීම<br><br>2009 මාර්තු මාසය සඳහා එකතු කල අගය මත බදු ගණනය කිරීම. | 51 | 119,974.98 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.04.01 සිට 2009.04.08 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>**ප්‍රමාණය** / **ඒකකමිල** / **වටිනාකම**<br>ඩීසල් ලී.848 70.20 - 59,529.60<br>එන්ජින් ඔයිල් ලී.05 කෑන් 01 1972.00 1,972.00<br>එන්ජින් ඔයිල් ලී.01 285.00 285.00<br>පැට්‍රල් ලී.54 120.20 6,490.80<br>ලේන්සු 01 40.00 40.00<br>68,317.40 | 53 | 68,317.40 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br><br>2009 අප්‍රේල් මාසයේ විදුලිබිල<br>පොදු වෙළඳසැල - 12,661.50<br>ප්‍රේක්ෂකාගාරය - 435.00<br>- 13,096.50 | 55 | 13,096.50 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br><br>2009 අප්‍රේල් මාසයේ කාර්යාලයේ විදුලිබිල | 56 | 17,205.00 |
| 2009.05.19 | බී.ගුණරත්න<br><br>නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් සැපයීම<br>2009.05.01 සිට 2009.05.15 දක්වා | 61 | 86,708.00 |

| | | | |
|---|---|---|---|
| 2009.05.25 | ටොයෝටා ලංකා පුද්ගලික සමාගම<br><br>එන්.ඩී.5124 වැන් රථයේ කි.මී.ලක්ෂයේ සේවා කටයුතු සඳහා | 65 | 42,729.63 |
| | ටොයෝටා ලංකා පුද්ගලික සමාගම<br><br>එන්.ඩී.5124 වැන් රථයේ කි.මී.ලක්ෂයේ සේවා කටයුතු වෙනුවෙන් අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම. | 66 | 74,103.23 |
| 2009.05.26 | කැන්ඩිටිම්බර් ඩීලර්ස්<br><br>තානායම් අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය දැව ලබාගැනීම<br>9 පළල සපු ලෑලි දිග අඩි 144<br>අඩි 01ක් 105 බැගින් 144ක් සඳහා - රු.15,120.00 | 68 | 15,120.00 |
| | ප්‍රියන්වදා එන්ටර්ප්‍රයිසස්<br><br>සෞඛ්‍ය අංශයට බෙහෙත් ඉසින ටැංකියක් හා පණුවන් මර්දනයට බෙහෙත් බෝතලයක් ගැනීම.<br><br>ලීටර් 16 ස්ප්‍රේයර් - 9,900.00<br>මිලි ලීටර් 200 කැල්කෝන් 570.00<br>-10,470.00 | 70 | 10,470.00 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.04.11 සිට 2009.04.17 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>ප්‍රමාණය ඒකකමිල වටිනාකම<br>ඩීසල් ලී.575 70.20 - 40,365.00<br>එන්ජින් ඔයිල් ලී.01 285.00 - 285.00<br>පැට්‍රල් ලී.26 120.20 - 3,125.20<br>- 43,775.20 | 72 | 43,775.20 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>2009.04.22 සිට 2009.04.24 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>ප්‍රමාණය ඒකකමිල වටිනාකම<br>ඩීසල් ලී.597 70.20 - 41,909.40<br>එන්ජින් ඔයිල් ලී.02 304.00 - 608.00<br>පැට්‍රල් ලී.52 120.20 - 6,250.40<br>ටූ.ටී. ලී.01 157.00 157.00<br>ඩී.එස්. කෑන් 02 1,558.00 3,116.00<br>- 52,040.80 | 73 | 52,040.80 |
| | ජෝති ස්ටෝර්ස්<br><br>කොම්පෝස්ට් ව්‍යාපෘතියේ වැඩමුළුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.<br><br>පීරිසි කුට්ටම් සෙට් එකක් 575 බැගින් 03 - 1,725.00<br>පෝසිලේන් පිගන් එකක් 110 බැගින් 50 - 5,500.00<br>වීදුරු එකක් 46 බැගින් 50 - 2,300.00<br>පීරිසි කුට්ටම් සෙට් එකක් 575 බැගින් 03 - 1,725.00<br>සිල්ව ට්‍රේ එකක් 400 බැගින් 02 - 800.00<br>අත් පිස්නා එකක් 25 බැගින් 06 - 150.00<br>කුඩා සබන් කැට එකක් 10 බැගින් 06 - 60.00<br>අත්මේස් එකක් 25 බැගින් 20 - 500.00<br>12,760.00 | 74 | 12,760.00 |
| | මෙට්‍රොපොලිටන් ඔෆීස් ප්‍රයිවට් ලිමිටඩ්<br><br>එන්.ඩී.1215 කැනොන් ෆොටෝකොපි යන්ත්‍රය 2009.06.01 සිට 2010.05.31 දක්වා වර්ෂක කාලයක සේවා ගිවිසුම අත්සන් කිරීම | 75 | 13,440.00 |

| | | | |
|---|---|---|---|
| | ජෝති ස්ටෝර්ස්<br><br>කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 76 | 18,410.00 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br><br>බැංකියවත්ත හා බලන්ගොඩ තානායම අලුත්වැඩියාව සඳහා සිමෙන්ති මිටි 75ක් මිලදි ගැනිම<br>එකක් 780 බැගින් මිටි 75ක් සඳහා 58,500.00 | 77 | 58,500.00 |
| | හර්ෂණ කලර් සෙන්ටර්<br><br>තානායම අලුත්වැඩියා කිරිම සඳහා අවශ්‍ය තීන්ත ලබා ගැනීම | 78 | 78,681.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br><br>2009 අප්‍රේල් මාසයේ දුරකථන බිල පියවීම.<br>2287275 - 5,647.71<br>2287153 - 3,664.27<br>2286596 - 3,461.55<br>2288737 - 7,417.73<br>ඊ-මේල් - 226.26<br>එකතුව -20,417.52 | 79 | 20,417.52 |
| | **2009 අප්‍රේල් මාසයේ ලංකා බැංකු ගිණුම** | | |
| 2009.04.03 | ලංකා බැංකු ගිණුමෙන් මහජන බැංකුවේ ගි.අ. 017100106351750 දරණ පොදු ගිණුම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 01 | 2,000,000.00 |
| | ලංකා විදුලි බල මණ්ඩලය<br><br>නව බස්නැවතුම්පොල සඳහා 2009 මාර්තු මස විදුලි බිල පියවීම. | 02 | 64,197.00 |
| | **2009 මැයි මාසයේ ලංකා බැංකු ගිණුම** | | |
| 2009.05.05 | කළමනාකරු , මහජන බැංකුව - බළන්ගොඩ<br><br>2009 පෙබරවාරි මස වැට්බදු ගෙවීමට ලංකා බැංකුවෙන් මහජන බැංකු ගිණුමට මුදල් ගෙවිම. | 04 | 50,515.68 |
| | ජල සම්පාදන මණ්ඩලය-2009 මාර්තු මාසයේ නව බස් නැවතුම්පොල ජල බිල පියවීම | 05 | 29,575.60 |
| 2009.05.12 | ලංකා විදුලි බල මණ්ඩලය<br><br>නව බස්නැවතුම්පොල සඳහා 2009 අප්‍රේල් මස විදුලි බිල පියවීම. | 06 | 90,527.40 |

| | | | |
|---|---|---|---|
| | එන්.එස්.ලියනගේ<br><br>බලන්ගොඩ බස්නැවතුම්පොලේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම හා පැති බැම්ම සහිත වැට ඉදිකිරිම.<br><br>කොන්ත්‍රාත්කරුට - 723,990.65<br>15% වැට් බදු 2/3 - 73,130.37<br>එකතුව - 797,121.02 | 07 | 797,121.02 |
| | එන්.එස්.ලියනගේ<br><br>බලන්ගොඩ බස්නැවතුම්පොලේ පිවිසුම් මාර්ගයේ පැති කාණු හා පදික වේදිකාව ඉදිකිරීම<br><br>කොන්ත්‍රාත්කරුට -148,567.26<br>15% වැට් බදු 2/3 - 15,006.79<br>එකතුව - 163,574.05 | 08 | 1,63,574.05 |
| | දේශීය ආදායම් කොමසාරිස්<br><br>බලන්ගොඩ බස්නැවතුම්පොලේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම හා පැති බැම්ම සහිත වැට ඉදිකිරිම.<br><br>දේශීය ආදායම් කොමසාරිස් 15% වැට්බදු 1/3 ගෙවීම | 07 | 36,565.18 |
| 2009.05.26 | ජල සම්පාදන මණ්ඩලය<br><br>2009 අප්‍රේල් මාසයේ නව බස් නැවතුම්පොල ජල බිල පියවීම | 09 | 41,134.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීමඃ**

ඇස්තමේන්තු කිසිවක් සභාවට ඉදිරිපත් නොවීය.

08.1 **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත

11. **යථා පරිදි කල් දී ඇති යෝජනාඃ**

නැත

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීමඃ**

09:01 **ටයර් රි-බිල්ට් කිරීමඃ**

මෙම සභාව සතු වාහන වලින් ගලවා ඉවත් කරන ලද ටයර් රි-බිල්ට් කිරීමට කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| ටයර් වල ප්‍රමාණය | පීඑස් ටයර් වර්ක්ස් රු. ශත | බලන්ගොඩ ටයර් සර්විස් රු. ශත | ජයන්ති ටයර් සෙන්ටර් රු. ශත |
|---|---|---|---|
| 11x20 –1 | 9900/- | 10,100/- | 10,000/- |
| 700x15- 1 | 4250/- | 4350/- | 4300/- |
| 700x16 -1 | 4100/- | 4350/- | 4100/- |
| 750x16-1 | 4900/- | 5100/- | 5000/- |
| 600x16 –1 | 2900/- | 3100/- | 3000/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් " පීඑස් ටයර් වර්ක්ස් " ආයතනයේ අවම මිල ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **ND-5124 වෑන් රථයට ටයර් 04 ක් මිළදී ගැනීම**

| ටයර් වර්ගය හා ප්‍රමාණය | එච්.අයි.ලියන් ඔටෝ ප්‍රයිවට් ලිමිටඩ් | ඔටෝ බොක්ස් ප්‍රයිවට් ලිමිටඩ් | යු. ඇන්ඩ් එච්.වීල් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් |
|---|---|---|---|
| 215/75X15 බ්‍රිජස්ටන් ටයර් 01 ක් | 16700/- | 16575/- | 16402.40 |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් අවම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යෝජනා:**

10:01 **ගරු උපසභාපති - සුමේද චාමින්ද බස්නායක මැතිතුමා**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ වසර ගණනාවකින් නඩත්තු නොකල මාර්ග 100% ප්‍රජාදායකත්ව ලබාගෙන ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාගේ සහභාගීත්වයෙන් සෑම සෙනසුරාදා දිනකම ප්‍රමුඛතාව මත තෝරාගත් මාර්ගයන් සභාවේ දායකත්වය ඇති සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10:02 **සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අවසන් කටයුතු සඳහා වියදම් දැරීම.**

සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ අවමගුල් උත්සවය සම්බන්ධ සාකච්ඡාවක් 2009.05.13 වන දින ගරු විදුලි බල හා බල ශක්ති අමාත්‍ය ඩබ්.ඩී.ජෝන් සෙනෙවිරත්න මැතිතුමා සහ සබරගමුව පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම නගර සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද අතර, එහි දී මෙම අවමඟුල් උත්සවය වෙනුවෙන් වැය වන මුදල් බළන්ගොඩ නගර සභාව, සහ බළන්ගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවන් විසින් දැරීමට යෝජනා වු බවත්, ඒ අනුව මෙම සභාව එම අවසන් කටයුතු වෙනුවෙන් රු.75,000/- ක මුදලක් වැය කිරීමට තීරණය කළ බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී . ඒ අනුව එම කටයුතු සඳහා රු.75,000/- ක උපරිම වියදමකට යටත්ව වියදම් දැරීමට සභාවේ එකඟතාවය ලබාදෙන ලෙස යෝජනාවක් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලදුව , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙම සභා අරමුදලින් රු.75,000/- ක මුදලක් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අවසන් කටයුතු වෙනුවෙන් දැරීම ඒකමතිකව සභා සම්මත කරන ලදී.

11. **කාරක සභාවල වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2009.04.01 දින සිට 2009.04.30 දින දක්වා මෙම සභාව සතු වැය වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව සභා සම්මත විය.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2009 වර්ෂයේ මැයි මාසයට අදාළ ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 3995620.41 |
| වෙනත් ලැබීම් | 2363947.19 |
| | ------------- |
| මුළු ලැබීම් | 7431415.60 |
| | |
| පුනරාවර්ථන වියදම | 2896324.62 |
| වෙනත් වියදම් | 1273723.05 |
| | ----------- |
| මුළු ගෙවීම් | 4170047.67 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු:**

13:01 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, දශක තුනකට ආසන්න කාලයක සිට පැවති රුදුරු කොටි ත්‍රස්තවාදය මේ මව්බිමෙන් අතුගා දමා මුළු මහත් ශ්‍රී ලංකා ද්වීපයම කොටි ත්‍රස්තවාදයෙන් මුදා ගැනීම සම්බන්ධව පළමුව සිය සතුට පළකරන බව දැන්වීය.

1986 වර්ෂයේ සිට කොටි ත්‍රස්තවාදය මේ රටින් තුරන් කිරීමට වරින් වර පත් වූ රාජ්‍ය නායකයින් උත්සාහ ගත් ද එම උත්සාහයන් සඵල නොවූ බවත්, නමුත් 2005 වර්ෂයේ මේ රටේ ජනාධිපති ලෙස පත් වූ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය දේශපාල දිවියේ ලද අත්දැකීම් උපයෝගී කරගෙන ත්‍රිවිධ හමුදාව මෙහෙයවා මවුබිමට අත්කරදුන් ජයග්‍රහණය ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන බව දැන්වීය. විදේශ රටවලින් පැමිණි බාධක මැඩලමින් රටේ ආර්ථික ,සංවර්ධන යුද්ධය ජය ගනිමින් අපේ මාතෘ භූමියට සැබෑ නිදහසක් ලබාදීම සම්බන්ධව අතිගරු ජනාධිපති උතුමාණන්ටත්, ආරක්ෂක ලේකම්තුමාටත්, ත්‍රිවිධ හමුදාවටත්, රට වෙනුවෙන් ඇප කැප වූ අභීත රණවිරුවන්ටත්, රට වෙනුවෙන් ජීවිත පූජා කළ රණවිරුවන්ට තමන්ගේ ගෞරවය සහ ප්‍රණාමය මෙම අවස්ථාවේ දී පළකර සිටින බව දැන්වීය.

වර්තමානයේ දී අප රට මුහුණ දී ඇති අභියෝගය වන්නේ මාතෘ භූමිය සංවර්ධනය කිරීමේ අභියෝගය බවත්, ඒ සඳහා අප සියළු දෙනාම එක්ව සහයෝගීව කටයුතු කල යුතු බවත්, විශේෂයෙන් ප්‍රාදේශීය දේශපාලන නායකයින් වන අප ද අනවශ්‍ය වියදම් අවම කරගෙන රටේ සංවර්ධනයට දායක වෙමින්, අතිගරු ජනාධිපතිතුමාගේ ඉදිරි වැඩ පිළිවෙල ශක්තිමක් කරමින් අලුත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට දායක වෙමු යැයි පැවසීය.

තවදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, දුටු ගැමුණු පරාක්‍රමබාහු වැනි නරපතීන් එදා මේ මව්බිම බේරාගත්තා සේම, මහින්ද රාජපක්ෂ ශ්‍රේෂ්ඨ නායකයා ද මේ රට සතුරන්ගෙන් බේරාගත් බවත්, එබැවින්, රාජපක්ෂ පරපුර මේ රටේ යාවජීව පරපුරක් විය යුතු බව අවධාරණය කරමින් සිය කථාව අවසන් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, මුළු මහත් ශ්‍රී ලංකා ද්වීපයම කොටි ත්‍රස්තවාදීගෙන් මුදාගැනීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, ත්‍රිවිධ හමුදාවත්, පොලිස්පතිතුමා ඇතුළු නිලධාරීන්ටත්, සිවිල් ආරක්ෂක බලකායටත් ,මව්බිම බේරාගන්නට ඇප කැප වු රණවිරුවන්ටත්, ජීවිත පුදකල රණවිරුවන්ටත් තමාගේ ගෞරවය හා ප්‍රණාමය පුදකරන බව දැන්වීය.

ත්‍රස්තවාදය ජයගත්තා සේම රට ගොඩනැංවීමේ සටන ද ජයගත යුතු බවත්, ඒ සඳහා අප සියළු දෙනාගේම සහයෝගය අතිගරු ජනාධිපතුමන් වෙත ලබාදිය යුතු බවත් පැවසීය.

වැඩිදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, මෙම සභාවේ ගරු සභාපතිතුමා ගම නැගුම , මග නැගුම ව්‍යාපෘතීන් හරහා මෙම ප්‍රදේශය තුළ විශාල සංවර්ධනයක් ඉටුකර තිබෙන බවත්, තමා නියෝජනය කරනු ලබන තුඹගොඩ වසම තුළ පමණක් එක්කෝටි තිස් හතර ලක්ෂයක සංවර්ධන කාර්යයන් ඉටුකර තිබෙන බවත්, පැවසීය. නගරය පවිත්‍රව තබාගැනීම සඳහා කුණු කසල කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කිරීමේ සාර්ථක ව්‍යාපෘතියක් ද ක්‍රියාවට නංවා ඇති අතර, ඊයේ දිනයේ දී ඝන අපද්‍රව්‍ය කලමනාකරණය කිරීමේ නව අංගනය පාඨලී චම්පික රණවක මැතිතුමා අතින් විවෘත කල බවත්, මෙම ව්‍යාපෘතියේ සාර්ථකවත්වය ප්‍රශංසාත්මකව අගය කල අතර, එතුමාගේ ස්තුතිය ගරු සභාපතිතුමන් වෙත පිරිනැමු බවත් දැන්වීය. මෙම සභාවේ කටයුතු මේ ආකාරයට ප්‍රශංසාවට ඇගයීමකට ලක්වීම සම්බන්ධව අප සියළු දෙනාටම සතුටුවිය හැකි බවත් දැන්වීය. ගරු සභාපතිතුමාගේ දක්ෂතාවය හා කැපවීම මෙම කටයුතු වල සාර්ථකත්වයට බලපා ඇති බවත්, පැවසු එතුමා, මෙම ව්‍යාපෘතියේ කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට සේවකයින්ගෙන් ලැබෙන සහයෝගය අප අගය කල යුතු අතර, ඔවුන්ගේ සුභසිද්ධිය උදෙසා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම සහ ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මහජන සුභ සිද්ධිය උදෙසා ගනු ලබන තීන්දු, තීරණ වලට ගරු මන්ත්‍රීවරුන්ගේ පුර්ණ සහයෝගය ලබාදෙන බවත්, පැවසු ගරු මන්ත්‍රීතුමා, ඇතැම් අවස්ථාවල දි ගරු සභාපතිතුමා සිය අභිමතය පරිදි පමණක් තීන්දු තීරණ ක්‍රියාවට නංවා පසුව අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බවත්, එවැනි අවස්ථාවල දී ගරු මන්ත්‍රීවරුන් අපහසුතාවකට ලක්වන බවත්, පැවසීය. එම නිසා, ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කොට අදාල තීරණයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

අද දින සභාවේ මුලාසනය ගරු උපසභාපතිතුමා, විසින් මෙහෙය වු අතර, එතුමා ඉතා යහපත් කාලෝචිත යෝජනාවන් රැසක් ඉදිරිපත් කල බවත්, නමුත් එතුමා සභා රැස්වීම් වලට සහභාගීවීමේ අඩුවක් දක්නට ලැබෙන බවත්, එම නිසා අදාල යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේ දී අපහසුතාවලට ලක්වන බවත් පැවසීය. කෙසේ වෙතත්,ඉදිරියේ දී එම අඩුපාඩු මගහරවගෙන ජනතා සුභසිද්ධියට අදාළව එතුමා කටයුතු කරනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවත් දැන්වීය.

බළන්ගොඩ නව බස්නැවතුම්පල අවට පරිශ්‍රයේ අලංකාරයට හානිවන ආකාරයට ව්‍යාපාර පවත්වාගෙන යන බවත්, එබැවින්, මේ කෙරෙහි සභාවේ අවධානය යොමුකරන බව පැවසීය.

මෙම රැස්වීම් ශාලාව වායු සමීකරණය කරන ලෙස තමන් ඉල්ලා සිටි බවත්, නමුත් එය ක්‍රියාත්මක නොවනු බවත්, පසුගිය දා අභාවප්‍රාප්ත වු මොහාන් එල්ලාවල මැතිතුමාගේ ආදහන උත්සවය සංවිධානය කිරීම පිළිබඳ මැති ඇමතිවරුන් හා විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම රැස්වීම් ශාලාවේ දී සාකච්ජාවක් පැවැත් වු බවත්, ඉඩකඩ ප්‍රමාණවත් නොවීම , විදුලිය විසන්ධිවීම හේතුවෙන් පැමිණ සිටි ජනතාව අපහසුතාවකට ලක් වු බවත් එබැවින්, මෙම රැස්වීම් ශාලාව වායු සමීකරණය කිරීමට අවධානය යොමු කරන ලෙස නැවතත් ඉල්ලා සිටින බව දැන්වීය.

13:03 **ගරු නගර සභා මන්ත්‍රී,එම්.ටී.එම්.රූමි මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, වසර 30 ක පමණ කලක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වුන කොටි ත්‍රස්තවාදී උපද්‍රව්‍ය මුලිනපුටා දැමීමට නායකත්වය ලබාදුන් අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා,ඇතුළු ත්‍රිවිධ හමුදාවට තමාගේ ගෞරවය හා සුභාශිංසනය පළකරන බව දැන්වීය.

බළන්ගොඩ ප්‍රදේශයේ දේශපාලනික , ආගමික වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් උසුලන ප්‍රදේශයක් බවත්, මෙම ප්‍රදේශයට ක්‍රීඩා අංශයෙන් ද කිර්තියක් ලබාදීමට ඉසුරු උදාන නැමති ක්‍රීඩකයා සමත්ව ඇති බවත්, මොහු මේ වන විට ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකත්වය ලබාගෙන තිබෙන බවත්, මොහුගේ ඉදිරි අනාගයතට මෙම නගර සභාවේ සුභාශිංසනය පළකරන අතර, ඒ බව ඔහු වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. **අවසානයඃ**

**ගරු උපසභාපති,සුමේද චාමින්ද බස්නායක මැතිතුමාඃ**

ගරු උපසභාපතිතුමා කථා කරමින්, ගරු නාගරික මන්ත්‍රී, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා තමන් සභාවට පැමිණීමේ අඩුවක් තිබෙන බවත්, සභා යෝජනා ක්‍රියාත්මක කිරීම සදහා ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කර සිටි බවත් ඒ සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් කලයුතුව තිබෙන බව දැන්වීය.

මහජන නියෝජිතයෙකුට හිමි වරප්‍රසාද අනුව නීත්‍යානුකුල ආකාරයට තමන්ට හිමි නිවාඩු ලබාගැනීමට හැකියාව තිබෙන බවත්, එම වරප්‍රසාදය අනුව තමන්ට නිවාඩු ලබාගත හැකි බවත් පැවසීය. තමන් මෙම සභාවේ මහජන නියෝජිතයෙකු ලෙස පත්කල ජනතාවට සේවය කිරීම තමාගේ ද අපේක්ෂාව වන බවත්,නමුත් තමන්ට හිමි වරප්‍රසාදය මේ සභාව තුළින් නැතිකිරීම සම්බන්ධව තමා ඉතා කණගාටුවන බවත් පැවසු ගරු උපසභාපතිතුමා, පසුගිය වර්ෂයේ ගම නැගුම වැඩ සටහන යටතේ වෙන් වු ලක්ෂ 05 ක මුදලින් තමන් නියෝජනය කරනු ලබන ප්‍රදේශය වන ඇල්ලෙපොල ප්‍රදේශයේ , ඇල්ලෙපොල මාලිගාතැන්න මාර්ගය සංවර්ධනය කිරීම සදහා අදාල කොන්ත්‍රාත්තුව ඇල්ලෙපොල ගොවි සංවිධානය වෙත භාරදුන් බවත්, එම සමිතිය විසින් කර්මාන්තයේ වැඩ අවසන් කර රැඳවුම් මුදල් ආපසු ලබාගැනීමට මෙම සභාවෙන් ඉල්ලීම් කල බවත්, එම අවස්ථාවේ දි විවිධ ගැටළු ඉදිරිපත් කරමින් එම මුදල් ගෙවීම ප්‍රමාද කිරීමට ගරු සභාපතිතුමා කටයුතු කල බවත්, එම හේතු නිසා කොන්ත්‍රාත් සමිති තමන් ඉදිරිපත් කරනු ලබන කර්මාන්ත වල වැඩ කටයුතු ඉටුකිරීමට අකමැත්ත ප්‍රකාශ කල බවත් පැවසීය. එම හේතුව තමන් දැඩි කළකිරීමකට පත්කල බවත්, තමන්ට වෙන් වෙන මුදල් වෙනත් සංවර්ධන යෝජනාවන් සදහා යොදවා ගැනීමට තමාගේ අකමැත්තක් නොමැති බවට ගරු සභාපතිතුමා තමන්ගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගත් බවත්, අකමැත්තෙන් වුවද තමාට එම ප්‍රකාශය ලබාදීමට සිදු වු බවත් පවසමින්,අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාටත් ලේකම් මහතාටත් සිය ස්තූතිය පිරිනමමින් සභාවේ වැඩ කටයුතු ප.ව.1.00 ට පමණ අවසන් කරන ලදී.

ආර්.ඩී.නලින් පුෂ්පකුමාර,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.